# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1997 අංක 2 දරන ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1997 පෙබරවාරි මස 28 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1997 පෙබරවාරි මස 28 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 3.40　　තැපැල් ගාස්තුව : රු. 2.50

# 1997 අංක 2 දරන ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1997 පෙබරවාරි මස 28 වන දින]

එල්. ඩී.—ඕ. 59/96

## 1995 අංක 30 දරන ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. මේ පනත 1997 අංක 2 දරන ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1995 අංක 30 දරන ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය පනතේ 4 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ : — 1995 අංක 30 දරන පනතේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

(i) ඒ වගන්තියේ (ඊ) ඡේදයේ "සැලසීමෙන්," යන වචනය වෙනුවට "සැලසීමෙන් ; " යන වචනය ආදේශ කිරීමෙන් සහ

(ii) ඒ වගන්තියේ (ඊ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(උ) වැඩසටහනේ අර්ථලාභීන්ට මුදලෙන් හෝ අන්‍යාකාරයෙකින් සහන සැලසීමෙන්,".

3. 1989 අංක 4 දරන ජනසවිය පනත යටතේ සාදන ලද නියෝග යටතේ නිකුත් කරන ලද්දාවූ ද, එකී පනත ඉවත් කිරීමට යෙදුනු දිනයට ඉහතින්ම වූ දිනයේ දී බලාත්මකව පැවතුනා වූ ද, හිමිකම් සහතිකයක් දැරුවා වූ ද, මාසයකට රුපියල් දෙසිය පණහක මුදලින් ගෙවීමක් ලබමින් සිටියා වූ ද, සෑම තැනැත්තෙක් ම, ප්‍රධාන ප්‍රඥප්තියේ පටහැනිව කුමක් සඳහන්ව තිබුන ද, ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ සකස් කරන ලද සමෘද්ධි ජාතික වැඩසටහන යටතේ සහන සඳහා ඉල්ලුම්කර සිටීමට සුදුසුකම් ලැබිය යුතු ය. — ජනසවිය වැඩ සටහන යටතේ සහන ලබන තැනැත්තන්ට සමෘද්ධි ජාතික වැඩ සටහන යටතේ සහන සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් තිබෙන බව.

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය. — අනනුකූලතාවක් ඇති වූ විට, සිංහල භාෂා පාඨය බලපැවැත් විය යුතු බව.

2–ඩී 041881 - 6,100 (96/10)